සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2024-08-10
පෙරවරු
[8.45 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 07

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, තොග හා සම්බන්ධ පිරිවැයක් වන්නේ කුමක් ද?

(1) ඇණවුම් කිරීමේ පිරිවැය. (2) තොග හිඟවීමේ පිරිවැය.

(3) රඳවාගැනීමේ පිරිවැය. (4) ඉහත සඳහන් සියල්ලම.

(ලකුණු 02)

**1.2** **සීමාසහිත ප්ලූටෝ පොදු සමාගම,** විසින් 2021 අප්‍රේල් 01 දින රු.1,200,000/- ක මිලකට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. සමාගම, එහි යන්ත්‍ර ක්ෂය කිරීම සඳහා හීනවන ශේෂ ක්‍රමය අනුගමනය කරනු ලබන අතර, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 10 කි. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයකළ ක්ෂය වන්නේ:

(1) රු.120,000/- කි. (2) රු.108,000/- කි. (3) රු.97,200/- කි. (4) රු.87,480/- කි.

(ලකුණු 02)

**1.3** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** ආදායම් යනු, හිමිකමෙහි (ස්කන්ධයෙහි) ඉහළයාමක් ඇති කරනු ලබන වත්කම්වල වැඩිවීමක් හෝ වගකීම්වල අඩුවීමක් වේ.

**(b)** ආදායම්, සමාගමේ අයිතිකරුවන් විසින් මූල්‍යයනය කරනු නොලබයි.

**(c)** ආදායම් තුළ අයභාරයන් ඇතුළත් වන නමුත් ලාභ ඇතුළත් නොවේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ආදායම්වලට අදාල නිවැරදි ප්‍රකාශ වනුයේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.4** 2024 අප්‍රේල් 30 දින හටගත් ගිනිගැනීමක් හේතුවෙන් **සීමාසහිත නෙප්චූන් පොදු සමාගමට** අයත් කර්මනාන්තශාලාවක් විනාශයට පත්වූ අතර, එයින් රු.4,000,000/- ක අලාභයක් සිදුවිය. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කිරීම සඳහා 2024 මැයි 31 දින අනුමත කරන ලදී.

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ගිනි ගැනීම නිසා සිදුවූ ඉහත අලාභය පිළිබිඹු කරනු ලබන්නේ කෙසේද?

(1) අලාභය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වියදමක් ලෙස සැලකීමට අවශ්‍ය වේ.

(2) මෙය මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමක් සිදුනොකරන අතර, හෙළිදරව් කිරීමක් සිදුකළ යුතුය.

(3) මෙය මීළඟ මූල්‍ය වර්ෂයට අදාළ වන බැවින් කිසිදු ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් මෙම වර්ෂයේදී සිදුකිරීමට අවශ්‍ය නොවේ.

(4) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මත පදනම්ව, වියදමක් ලෙස හඳුනාගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට තීරණය කිරීමට පුළුවනි. (ලකුණු 02)

**1.5** පහත සඳහන් තොරතුරු, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සත් සමාගමට** අදාලව ලබාදී ඇත:

| | **පිරිවැය ගිණුම් අනුව (රු.)** | **මූල්‍ය ගිණුම් අනුව (රු.)** |
|---|---|---|
| ආරම්භක තොගය: | | |
| අමු ද්‍රව්‍ය | 55,000 | 62,000 |
| නිමි භාණ්ඩ | 75,000 | 60,000 |
| අවසාන තොගය: | | |
| අමු ද්‍රව්‍ය | 45,000 | 55,000 |
| නිමි භාණ්ඩ | 80,000 | 72,000 |

පිරිවැය ගිණුම් අනුව ලාභය රු.352,000/- ක් නම්, මූල්‍ය ගිණුම් අනුව ලාභය වනුයේ:

(1) රු.346,000/-. (2) රු.342,000/-. (3) රු.358,000/-. (4) රු.362,000/-.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.6** ABC පිරිවැයකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

**1.7** පහත සඳහන් එක් එක් දෑ සඳහා 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ ඇති ප්‍රතිපාදනය සඳහන් කරන්න:

(i) හවුල්කරුවන්ගේ වේතනය.

(ii) හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය හඳුන්වාදීම.

(iii) නව හවුල්කරුවෙකු බඳවා ගැනීම. (ලකුණු 03)

**1.8** පහත සඳහන් එක් එක් කරුණ යටතේ, පිරිවැය ගිණුම්කරණය, මූල්‍ය ගිණුම්කරණයෙන් වෙනස්කොට දක්වන්න:

(i) අරමුණ.

(ii) ගනුදෙනුවල ආවරණය.

(iii) තොග අගය කිරීම. (ලකුණු 03)

**1.9** ණයකරයකට (debenture) විශේෂ වූ ලක්ෂණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.10** **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම,** එකතුකළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි . පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අදාළ වේ:

| | රු. |
|---|---|
| 2024 ජනවාරි 01 දින එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය | 125,000 |
| විකුණුම් (එකතුකළ අගය මත බදු රහිතව) | 990,000 |
| ගැනුම් (එකතුකළ අගය මත බදු රහිතව) | 360,000 |
| විකුණුම් ආපසු එවුම් (එකතුකළ අගය මත බදු රහිතව) | 45,000 |

*(සියලුම මිලදී ගැනීම් සහ විකිණීම් සඳහා බදු ඉන්වොයිස් ඇත.)*

ඉහත සඳහන් තොරතුරු අනුව, අදාලවන එකතුකළ අගය මත බදු අනුපාතය 18% ක් නම්, 2024 මාර්තු 31 දිනට ගෙවිය යුතු එකතුකළ අගය මත බදු ශේෂය ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**ශක්ති** විසින් බතික් ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් 2024 මාර්තු 01 දිනට ආරම්භ කරන ලද අතර, එය **ශක්ති බතික් ඩිසයින්ස්** ලෙස නම්කරන ලදී.

**ශක්ති** විසින් සියලුම මුදල් ලැබීම් බැංකු ගත කර ඇති අතර, සියලු වියදම් චෙක්පත් මගින් පමණක් සිදුකරයි. සියලුම ලැබීම් හා ගෙවීම්, මුදල් පොතෙහි වාර්තා කරනු ලබයි.

**ශක්ති බතික් ඩිසයින්ස්** හි 2024 මාර්තු මාසයට අදාල මුදල් පොතෙහි උද්ධෘතයක් පහත දැක්වේ:

**මුදල් පොත (බැංකු තීරුව)**

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | හර (රු.) | බැර (රු) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2024-03-01 | මුදල් තැන්පතුව - **ශක්තිගේ මූලික ආයෝජනය** | | 575,000 | | 575,000 |
| 2024-03-01 | නිර්මානකරණ උපකරණයක් මිලට ගැනිම | 587230 | | 120,000 | 455,000 |
| 2024-03-01 | බතික් සාප්පුවෙහි කාර්යාල වියදම් | 587231 | | 26,200 | 428,800 |
| 2024-03-04 | ව්‍යාපාර ලියාපදිංචි වියදම් | 587232 | | 5,300 | 423,500 |
| 2024-03-04 | රෙදි මිලට ගැනිම සඳහා වූ ගෙවීම් | 587233 | | 325,000 | 98,500 |
| 2024-03-04 | බතික් නිර්මානකරණය සඳහා වූ අනෙකුත් අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වූ ගෙවීම් | 587234 | | 68,300 | 30,200 |
| 2024-03-11 | මුදල් තැන්පතුව - විකුණුම් | | 320,000 | | 350,200 |
| 2024-03-16 | **ශක්තිගේ** පෞද්ගලික ගිණුමේ තැන්පත් කිරීම් | 587235 | | 65,000 | 285,200 |
| 2024-03-17 | රෙදි මිලදී ගැනිම සඳහා ගෙවීම් | 587236 | | 333,000 | (47,800) |
| 2024-03-18 | මුදල් තැන්පතුව - විකුණුම් | | 225,000 | | 177,200 |
| 2024-03-25 | මුදල් තැන්පතුව - විකුණුම් | | 118,500 | | 295,700 |
| 2024-03-31 | බැංකු ගාස්තු | | | 2,500 | 293,200 |
| 2024-03-31 | ප්‍රදර්ශනාගාරයේ වියදම් | 587237 | | 8,200 | 285,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු මාසයට අදාල රු.12,500/- ක කාර්යාල ගොඩනැගිලි කුලිය, 2024 අප්‍රේල් මාසයේදී ගෙවා ඇත.

(2) 2024 මාර්තු 31 දිනට තිබූ නිමි ඇඳුම් තොගය රු.244,100/- ක් වූ අතර, 2024 මාර්තු 31 දිනට නොනිමි බතික් ඇඳුම් තොගයක් නොවීය.

(3) 2024 මාර්තු 31 දින සිදුකළ විකුණුම් සඳහා ලද රු.23,500/- ක මුදල, 2024 අප්‍රේල් 01 දින බැංකුවේ තැන්පත් කර ඇති අතර, මෙය මුදල් පොතෙහි සටහන් කර නැත.

(4) නිර්මානකරණ උපකරණ, ඒවායෙහි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. එම උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 4 කි.

(5) මිලදී ගත් රෙදි වෙනුවෙන් 2024 මාර්තු 31 දිනට ගෙවිය යුතු මුදල රු.45,000/- ක් වේ.

(6) 2024 මාර්තු මාසය සඳහා වන රු.8,000/- ක විදුලි බිල්පත සඳහා ගෙවීම 2024 අප්‍රේල් මාසයේදී සිදුකරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ශක්ති බතික් ඩිසයින්ස්** හි පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය (ලකුණු 08)

(b) 2024 මාර්තු 31 දිනට ප්‍රාග්ධන (ස්කන්ධය) ශේෂය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**වරිත්, සුරිත්** සහ **තිසිත්, CSN Leasure** (සංචාරක හෝටලයක්) නම් වූ හවුල් ව්‍යාපාරයක් 2023 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර, ලාභා'ලාභ පිළිවෙලින් 2 : 1 : 2 අනුපාතය යටතේ බෙදා ගනී.

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- **තිසිත්** හවුල් ව්‍යාපාරය කළමනාකරණය කරනු ලබන අතර, ඒ වෙනුවෙන් ඔහුට මාසයකට රු.100,000/- ක වේතනයක් හිමි වේ.
- හවුල් ව්‍යාපාරයට ලබාදෙන ණය වෙනුවෙන් හවුල්කරුවන්ට 12% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- යෙදවූ ආරම්භක ප්‍රාග්ධනය මත, වාර්ෂිකව 10% ක ප්‍රාග්ධනය මත පොලියකට හවුල්කරුවන් හිමිකම් ලබයි.

(2) **වරිත්ට** අයත් පැරණි නිවසක් සංචාරක හෝටලය ලෙස නවීකරණය කරන ලද අතර, සංචාරකයින් වෙත නවාතැන් පහසුකම් සැපයීම සඳහා එය හවුල් ව්‍යාපාරය වෙත කුලී පදනම මත ලබා දී ඇත. බදු කුලී වශයෙන් මුළු නවාතැන් ආදායමෙන් 10% ක ප්‍රමාණයක් ලබාගැනීමට **වරිත්ට** හිමිකමක් තිබේ. වර්ෂයට අදාල බදු කුලිය වර්ෂය තුළදී ගෙවා නොමැති අතර, ඒ සඳහා ගිණුම් සටහන් ද තබා නොමැත.

(3) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හවුල් ව්‍යාපාරයේ මුළු නවාතැන් ආදායම හා ශුද්ධ ලාභය පිළිවෙලින් රු.6,000,000/- ක් සහ රු.4,330,000/- ක් වේ.

(4) 2023 අප්‍රේල් 01 දින, **තිසිත්** විසින් රු.2,400,000/- ක ණයක්, හවුල් ව්‍යාපාරයට ලබාදී ඇති අතර, 2024 අප්‍රේල් මාසයේදී ගෙවන ලද ඊට අදාල වාර්ෂික පොලිය තවමත් ගිණුම්ගත කර නොමැත.

(5) හවුල් ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් ශේෂයන් උපුටාගෙන ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2023 අප්‍රේල් 01 දින යෙදවූ ප්‍රාග්ධනය: | | |
| **වරිත්** | | 960 |
| **සුරිත්** | | 840 |
| **තිසිත්** | | 1,500 |
| ණය මුදල - **තිසිත්** | | 2,400 |
| වර්ෂය තුළ ගැනිලි: | | |
| **වරිත්** | 600 | |
| **තිසිත්** | 750 | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, **CSN Leasure** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 05)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ වන සතුන් හා වනාන්තර සුරැකීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සිටින පරිසරවේදීන් කණ්ඩායමක් **Wild Life Lovers** නම් වූ සංවිධානයක් 2020 අප්‍රේල් මාසයේදී පිහිටුවාගන්නා ලදී.

**Wild Life Lovers** ට අදාලව පහත සඳහන් තොරතුරු ලබාදී ඇත:

(1) 2023 අප්‍රේල් 01 දිනට සංවිධානයේ සාමාජිකයින් 53 දෙනෙක් සිටියහ. ඒ අතුරින්, සාමාජිකයින් 5 දෙනෙකු විසින් 2023/24 වසරද ඇතුළුව ඉදිරි වසර 3 ක් සඳහා සාමාජික ගාස්තු 2023 මාර්තු 31 දිනට ගෙවා තිබුණි. සාමාජිකයින් 3 දෙනෙකු 2023/24 වසරට අදාළ සාමාජික මුදල 2024 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණි. 2023/24 වර්ෂය තුළදී 2023/24 වර්ෂයට අදාල සාමාජික ගාස්තු ගෙවමින් නව සාමාජිකයින් 12 දෙනෙකු සංවිධානයට බැඳී තිබුණි. සාමාජිකයෙකු සඳහා වන සාමාජික ගාස්තුව වර්ෂයකට රු.15,000/- ක් ලෙස ස්ථාවරව පවතී. 2023 අප්‍රේල් 01 දින වන විට කිසිදු හිඟ සාමාජික මුදලක් නොතිබුණි.

(2) **Wild Life Lovers** විසින් වන සතුන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී කොළඹදී ප්‍රදර්ශනයක් පවත්වන ලදී. ප්‍රදර්ශනය සඳහා ඇතුලත්වීමේ ගාස්තුවක් අය නොකරන ලදී. ප්‍රදර්ශනය සඳහා රු.50,000/- ක මුදලක් අනුග්‍රහ ලෙස ලැබී තිබුණි. මෙයට අමතරව ප්‍රදර්ශන පරිශ්‍රයේදී සාමාජිකයින් විසින් ලබාගන්නා ලද ඡායාරූප හෝ ඔවුන් විසින් සම්පාදනය කරන ලද ප්‍රකාශන අලෙවි කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබුණි. එලෙස අලෙවි කිරීම මගින් රු.1,500,000/- ක මුදලක් එකතු කරගන්නා ලද අතර, එම මුදලින් 10% ක ප්‍රමාණයක් අදාල සාමාජිකයා වෙත ලබාදුන් අතර, ඉතිරි 90% ක ප්‍රමාණය **Wild Life Lovers** වෙත රඳවාගෙන තිබුණි.

(3) **Wild Life Lovers** හි 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම්වල සාරාංශයක් පහත දැක්වේ:

*(රු. '000)*

| | |
|---|---|
| කුලී වියදම | 1,300 |
| ප්‍රවර්ධන වියදම් | 240 |
| පරිපාලන සහායක වෙත ගෙවූ වේතන | 360 |
| විදුලි හා ජල බිල්පත් | 8 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 50 |

(4) **Wild Life Lovers** කොළඹ පිහිටි ගොඩනැගිල්ලක පිහිටා ඇති අතර, ගොඩනැගිල්ල සඳහා වූ මාසික කුලිය රු.30,000/- කි. ඉතිරි කුලී වියදම් ප්‍රමාණය, ප්‍රදර්ශනය සඳහා ලබාගත් ශාලාවට අදාල වේ.

(5) ප්‍රවර්ධන වියදම් මුළුමනින්ම දරණ ලද්දේ ප්‍රදර්ශනය සඳහා වන අතර, මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදමෙන් 10% ක ප්‍රමාණයක්ද ඒ සඳහා දරණ ලදී.

(6) **Wild life Lovers** විසින් සංවිධානය ආරම්භයේදීම පරිගණක යන්ත්‍ර 2 ක් මිලදී ගන්නා ලද අතර, ඒ සඳහා දැරූ පිරිවැය රු.500,000/- ක් විය. පරිගණක යන්ත්‍ර ඒවායේ පිරිවැය මත වර්ෂයකට 20% ක අනුපාතය යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කල යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **Wild Life Lovers** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 04)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත Fabric Mall (පෞද්ගලික) සමාගම,** රෙදි නිෂ්පාදනයේ නිරත වී සිටින අතර, සංකලිත (integrated) ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි.

පහත සඳහන් ශේෂයන් ගිණුම්කරණ පද්ධතියෙන් උපුටාගන්නා ලදී:

| **තොගය** | **2024 මාර්තු 01 දිනට (රු.)** |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය | 950,750 |
| නොනිමි තොගය | 275,600 |
| නිමි භාණ්ඩ තොගය | 1,850,300 |

2024 මාර්තු මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුකර ඇත:

| | **රු.** |
|---|---|
| ණය පදනම මත මිලට ගත් අමුද්‍රව්‍ය | 2,300,000 |
| නිෂ්පාදනය සඳහා නිකුත් කළ අමුද්‍රව්‍ය | 1,550,000 |
| නිෂ්පාදනය සඳහා වන සෘජු වැටුප් | 700,000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 350,000 |
| නිමි භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය | 2,800,000 |
| විකුණූ භාණ්ඩවල පිරිවැය | 2,450,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් ගිණුම් **පිළියෙල කරන්න**:

(a) අමුද්‍රව්‍ය පාලන ගිණුම. (ලකුණු 02)

(b) නොනිමි පාලන ගිණුම. (ලකුණු 03)

(c) නිමි භාණ්ඩ පාලන ගිණුම. (ලකුණු 02)

(B) පහත සඳහන් තොරතුරු සීමාසහිත **ABC සමාගමේ, කාර්යය අංක A10000** ට අදාලව උපුටාගෙන ඇත:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | කිලෝ ග්‍රෑම් එකක් රු.400/- බැගින් කිලෝ ග්‍රෑම් 7,500 |
| සෘජු ශ්‍රමය - A දෙපාර්තමේන්තුව | පැයකට රු.1,500/- බැගින් පැය 250 |
| - B දෙපාර්තමේන්තුව | පැයකට රු.750/- බැගින් පැය 500 |
| නිෂ්පාදන පොදුකාර්ය | මුළු සෘජු ශ්‍රම පිරිවැයෙන් 80% |

සමාගම විකුණුම් මිලෙන් 20% ක ලාභයක් පවත්වා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක A10000** මත අයකළ යුතු මිල **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත Moon සමාගම,** සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය **A අමුද්‍රව්‍ය** බාහිර සැපයුම්කරුවෙකුගෙන් ඒකකයක් රු.60/- බැගින් මිලට ගනී. **A අමුද්‍රව්‍ය** ට අදාලව පහත සඳහන් තොරතුරු ද දී ඇත:

- **A අමුද්‍රව්‍යයෙහි** වාර්ෂික ඉල්ලුම, ඒකක 6,400 කි.
- අමුද්‍රව්‍ය ඒකකයක් සඳහා වර්ෂයකට ගබඩා පහසුකම් වෙනුවෙන් වූ කුලිය හා රක්ෂණ පිරිවැය රු.2/- කි.
- ඇණවුමක් සිදුකිරීම සඳහා වූ පිරිවැය රු.100/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**A අමුද්‍රව්‍යයට** අදාලව පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 03)

(b) ඇණවුම් කළ යුතු ප්‍රශස්ත ඇණවුම් ගණන. (ලකුණු 02)

(B) **සීමාසහිත Moon සමාගමේ** වාර්තාවලින් එහි එක් සේවකයෙකුට අදාලව පහත සඳහන් වැටුප් විස්තර උපුටාගෙන ඇත:

| | |
|---|---|
| පැයකට අදාල වැටුප් අනුපාතය | රු.200/- |
| එක් කැල්ලක් නිම කිරීමට ගන්නා සම්මත කාලය | මිනිත්තු 24 |
| සතියෙහි සත්‍ය නිමැවුම | කෑලි 120 |
| සතියකට වැඩකරන පැය ගණන | පැය 40 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

සේවකයෙකු ඉතිරි කරගන්නා ලද කාලය සඳහා පැයක වැටුප් අනුපාතයෙන් 150% ක් බැගින් වූ ප්‍රසාද දීමනාවකට හිමිකම් ලබයි නම්, සේවකයාගේ සතියක ඉපැයීම **ගණනය කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත C-Lanka (පෞද්ගලික) සමාගමේ** 2024 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ: (රු.)

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 1,000,000 |
| 2023 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 5,269,000 |
| මෝටර් වාහන, පිරිවැයට | 12,000,000 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 2,550,000 | |
| **2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| මෝටර් වාහන | | 6,000,000 |
| කාර්යාල උපකරණ | | 1,020,000 |
| බැංකු ණය මුදල | | 4,650,000 |
| බැංකුවේ ඇති මුදල් | 4,937,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,140,000 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 726,000 |
| විකුණුම් | | 32,865,000 |
| විකුණුම් පිරිවැය | 13,146,000 | |
| ගෙවූ කාර්යාල කුලිය | 633,000 | |
| ඉන්ධන වියදම් | 431,000 | |
| ප්‍රචාරණ සහ අලෙවිකරණ වියදම් | 729,000 | |
| විකුණුම් කොමිස් | 978,000 | |
| ජලය සහ විදුලිය | 132,000 | |
| කාර්යාල නඩත්තු වියදම් | 357,000 | |
| වේතන, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) | 9,395,000 | |
| බැංකු ගාස්තු | 15,000 | |
| බැංකු ණය පොලිය | 674,000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 97,000 | |
| 2023 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 208,000 |
| ගෙවූ ආදායම් බදු | 625,000 | |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාර අරමුදල් (ETF) | | 12,000 |
| මෝටර් වාහන ඉවත්කිරීමේ ගිණුම | | 3,525,000 |
| 2024 මාර්තු 31 දිනට තොගය | 2,436,000 | |
| | **55,275,000** | **55,275,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දින පිරිවැයට අගය කරන කරන ලද අවසාන තොගය ගිණුම් පොත්වල වාර්තා කර ඇත. එම තොගයෙන් $\frac{1}{3}$ ක ප්‍රමාණයක් හානිවී තිබූ බව පසුව අනාවරණය වූ අතර, 2024 අප්‍රේල් මාසයේදී පිරිවැයෙන් 50% ක වට්ටමක් යටතේ එම තොගය විකුණා ඇත. කෙසේනමුත්, මෙය පොත්වල ගලපා නොමැත.

(2) දැනට සිටින කාර්යාල පරිශ්‍රය 2023 අප්‍රේල් 01 දින සිට මාසයකට රු.25,000/- බැගින් වන කුලියකට යටත්ව බදු පදනම මත ලබාගෙන ඇත. තවද, 2024 ජනවාරි 01 දින සිට මාසයකට රු.37,000/- ක කුලියකට යටත්ව නව විකුණුම් කාර්යාලයක්ද සමාගම බදු පදනම මත ලබාගෙන තිබේ. මාසික බදු කුලියට අමතරව, නව විකුණුම් කාර්යාලය වෙනුවෙන් මාස 6 ක කුලිය ඉදිරියට ගෙවා ඇත. සමාගම සියලුම කාර්යාල කුලී නිසි පරිදි ගෙවා ඇති අතර, එය ගෙවූ කාර්යාල කුලී ගිණුමට හර කර ඇත.

(3) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |

(4) 2022 ජනවාරි 01 දින, රු.4,000,000/- කට මිලට ගත් මෝටර් රථයක් 2023 දෙසැම්බර් 31 දින රු.3,525,000/- ක මුදලකට විකුණා ඇත. විකිණීමෙන් ලද සම්පූර්ණ මුදල, මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුමට බැර කර ඇත. මෙයට අමතරව වෙනත් කිසිදු සටහනක් පොත්වල තබා නොමැත.

(5) 2024 මාර්තු මාසය සඳහා වන රු.13,000/- ක් වූ විදුලි බිල්පත 2024 අප්‍රේල් මාසය මැදදී ගෙවා ඇත.

(6) 2023/24 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම රු.827,000/- ක් ලෙස සමාගම විසින් ඇස්තමේන්තුගත කර ඇති අතර, එයින් රු.625,000/- ක් කාර්තුමය වාරික ලෙස වර්ෂය තුළදී ගෙවා ඇත.

(7) 2024 මාර්තු 31 දිනට පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය මත 5% ක ප්‍රතිපාදනයක් පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

(8) 2024 මාර්තු 31 දින, රු.1,000,000/- ක් පොදු සංචිත ගිණුමට මාරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

(9) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2024 මැයි 31 දින ලබා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත C-Lanka (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |